අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

53

මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/6/2

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.04. 22

**චක්‍රලේඛ අංකය: 19 /2025**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කොට්ඨාස භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම පරිවෙණාධිපති හිමිවරුන්

සියලු ම විදුහල්පතිවරුන් වෙත

**<u>සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය - 2025</u>**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් වාර්ෂිකව පැවැත්වෙන උක්ත තරගයෙහි 2025 වර්ෂයට නියමිත කොන්දේසි, උපදෙස් සහ නිර්මාණ ඉදිරිපත් කළ යුතු ශීර්ෂ පිළිබඳ තොරතුරු මේ සමග ඇත. මේ පිළිබඳව අදාළ ගුරුභවතුන් සහ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් දැනුවත් කර මෙම තරගයට ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කරවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වමි.

මේ සඳහා ඉදිරිපත් වන සියලු ම තරගකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවක ම මෙම චක්‍රලේඛයේ සඳහන් සියලු කොන්දේසි පිළිපැදීමට එකඟ ව කටයුතු කළ යුතු ය.

නාලක කලුවැව
ලේකම්

# සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය - 2025

## හැඳින්වීම

මෙරට පාසල් සිසු දරුදැරියන්ට සහ ගුරුභවතුන්ට චිත්‍රකලා විෂයානුබද්ධ නිර්මාණකරණයෙහි නිරත වීමට අවස්ථාවන් සම්පාදනයත්, එමගින් ඔවුන්ගේ ශිල්පීය කුසලතාවන් පෝෂණය කිරීම පිණිස ප්‍රායෝගික හා විෂයානුබද්ධ අත්දැකීම් රාශියක් ලබා දීමත්, එමෙන් ම ඔවුන්ගේ වින්දන ශක්තීන් දියුණු කිරීමත් උදෙසා මෙම තරගය සංවිධානය කෙරේ. මෙරට සෞන්දර්ය අධ්‍යාපනයේ පුරෝගාමීන්ගේ කැපවීම මත ක්‍රමානුකූලව විවිධ ස්වරූපයන්ගෙන් යුක්තව වැඩි දියුණු වෙමින් අඛණ්ඩව පැවත ආ මෙය, වර්තමානයේ දී චිත්‍රකලා අධ්‍යාපනයෙහි කාලීන අවශ්‍යතාවන්ට අනුකූල වැදගත් සහ අත්‍යවශ්‍ය වාර්ෂික වැඩසටහනක් ලෙසින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම තරගයේ දී ජාතික මට්ටමින් ඇගැයීමට ලක් කෙරෙන සිසු දරුදැරියන් උසස් අධ්‍යාපනයට යොමු වීමේ දී ප්‍රමුඛතාවට පත් වේ.

## 1. සහභාගීත්වය හා ඉදිරිපත් වීම

1.1 රජයේ පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අනුමත පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද, සියලු පිරිවෙන් විද්‍යායතනවල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ද, ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද මෙම තරගය සඳහා සහභාගි විය හැකි ය. ඒ සඳහා පහත තරග ශීර්ෂ ඉදිරිපත් කෙරේ. මෙම තරග ශීර්ෂ ආශ්‍රිත වැඩිදුර පැහැදිලි කිරීම් මෙහි අවසානයට ඇති 'ඇමුණුම- 01' යටතේ 'චිත්‍ර තරග ශීර්ෂ, ඊට අදාළ නිර්ණායක හා මාධ්‍ය වර්ගීකරණය' යනුවෙන් ඉදිරිපත් කර ඇත.

| ශ්‍රේණි | ශීර්ෂ අංක | තරග ශීර්ෂ |
|---|---|---|
| 6 -7 | | පින්තාරුකරණය |
| | 1 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය |
| | 2 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය |
| | 3 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය |
| | 4 | ප්‍රකාශන චිත්‍ර - මිශ්‍ර මාධ්‍යය |
| | 5 | මෝස්තර නිර්මාණ |
| | 6 | ග්‍රැෆික් නිර්මාණ (පොත් පිටකවර නිර්මාණය) |
| 8 -9 | 7 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය |
| | 8 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය |
| | 9 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය |
| | 10 | ප්‍රකාශන චිත්‍ර - මිශ්‍ර මාධ්‍යය |
| | 11 | මෝස්තර නිර්මාණ |
| | 12 | ග්‍රැෆික් නිර්මාණ |
| 10 11 | | පින්තාරුකරණය |
| | 13 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය |
| | 14 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය |
| | 15 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය |
| | 16 | ප්‍රකාශන චිත්‍ර -මිශ්‍ර මාධ්‍යය |
| | 17 | සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීන් ඇසුරින් ප්‍රකාශන චිත්‍ර |
| | 18 | සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම |
| | 19 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - දිය සායම් මාධ්‍යය |
| | 20 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය |
| | 21 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - කොලාජ් මාධ්‍යය |
| | 22 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - මිශ්‍ර මාධ්‍යය |
| | 23 | භූමි දර්ශන සිතුවම් |
| | 24 | උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය - ඒකවර්ණ) |

| | | |
|---|---|---|
| | | මෝස්තර |
| | 25 | ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ |
| | 26 | නව සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ |
| | 27 | නව්‍යමය හැඩති පාරිහාරික භාණ්ඩ ඇඳීම (සැලසුම් නිර්මාණ) |
| | | ග්‍රැෆික් නිර්මාණය (මුද්‍රිත මාධ්‍යය) |
| | 28 | පෝස්ටර් නිර්මාණ |
| | 29 | සන්නිදර්ශන නිර්මාණ |
| | 30 | නිෂ්පාදන ඇසුරුම්/ දවටන/ ලේබල |
| | 31 | පොත් පිටකවර |
| | 32 | චිත්‍ර කතා නිර්මාණ |
| | 33 | පුවත්පත් කාටූන් |
| | 34 | පරිගණක නිර්මාණ -1 (පෝස්ටර් නිර්මාණ, පොත් පිටකවර, නිෂ්පාදන ඇසුරුම් දවටන /ලේබල) |
| | 35 | පරිගණක නිර්මාණ -2 (සන්නිදර්ශන නිර්මාණ) |
| | | විශේෂ තරග - මූර්ති නිර්මාණ |
| | 36 | ඇඹීම |
| | 37 | නෙළීම |
| | 38 | එකලස් කිරීම |
| 12 -13 | | පින්තාරුකරණය |
| | 39 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය |
| | 40 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ සන දියර මාධ්‍යය |
| | 41 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය |
| | 42 | ප්‍රකාශන චිත්‍ර - මිශ්‍ර මාධ්‍යය |
| | 43 | සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම |
| | 44 | සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීන් ඇසුරින් ප්‍රකාශන චිත්‍ර |
| | 45 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - දිය සායම් මාධ්‍යය |
| | 46 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - පැස්ටල් හෝ සන දියර මාධ්‍යය |
| | 47 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - කොලාජ් මාධ්‍යය |
| | 48 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - මිශ්‍ර මාධ්‍යය |
| | 49 | නිශ්චල ද්‍රව්‍ය සංරචනය |
| | 50 | භූමි දර්ශන සිතුවම් -1 |
| | 51 | භූමි දර්ශන සිතුවම් -2 |
| | 52 | උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය - ඒකවර්ණ) |
| | 53 | උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය - බහුවර්ණ) |
| | | මෝස්තර |
| | 54 | සාම්ප්‍රදායික බිතුසිතුවම් සැරසිලි ඒකක බලා ඇඳීම |
| | 55 | සාම්ප්‍රදායික සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ |
| | 56 | නව සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ |
| | 57 | නව්‍යමය හැඩති පාරිහාරික භාණ්ඩ ඇඳීම (සැලසුම් නිර්මාණ) |
| | | ග්‍රැෆික් නිර්මාණය (මුද්‍රිත මාධ්‍යය) |
| | 58 | පෝස්ටර් නිර්මාණ |
| | 59 | සන්නිදර්ශන නිර්මාණ |
| | 60 | පොත් පිටකවර |
| | 61 | නිෂ්පාදන ඇසුරුම්/ දවටන/ ලේබල |
| | 62 | චිත්‍ර කතා නිර්මාණ |
| | 63 | පුවත්පත් කාටූන් |
| | 64 | පරිගණක නිර්මාණ -1 (පෝස්ටර් නිර්මාණ, පොත් පිටකවර, නිෂ්පාදන ඇසුරුම් දවටන /ලේබල) |
| | 65 | පරිගණක නිර්මාණ -2 (සන්නිදර්ශන නිර්මාණ) |

| | | |
|---|---|---|
| | **විශේෂ තරග - මූර්ති නිර්මාණ** | |
| | 66 | ඇඹීම |
| | 67 | නෙළීම |
| | 68 | එකලස් කිරීම |

## 2 තරගය සඳහා පොදු උපදෙස් :

2.1 එක් සිසුවෙකුට හෝ සිසුවියකට ඉදිරිපත් විය හැක්කේ ඉහත තරග ශීර්ෂවලින් එකකට පමණි. එහෙත් විශේෂ අංශයක් වන මූර්ති නිර්මාණ තරග අංශය සෘජුව ම ජාතික වටයේ තරගයක් වශයෙන් පැවැත්වේ. ඒ සඳහා ඉදිරිපත් වන්නෙකුට එම විශේෂ ශීර්ෂ එකක් ඇතුළුව තම ශ්‍රේණි පරාසයට අයත් වෙනත් ශීර්ෂයකට ඉදිරිපත් විය හැකි ය.

2.2 ප්‍රකාශන, මෝස්තර හා ග්‍රැෆික් තරග ශීර්ෂවලට අයත් නිර්මාණ පාසල්, කලාප හා ජාතික තරග සඳහා ඉදිරිපත් කිරීමේ දී **නිර්මාණවල ප්‍රමාණය A3 විය යුතු ය.** ජාතික තලයේ දී මේ සඳහා ඇඳීමේ කඩදාසි සපයනු ලැබේ. සියලු ම තරගකරුවන් තම නිර්මාණයට අවශ්‍ය වර්ණ මාධ්‍ය, සෙසු උපකරණ හා ද්‍රව්‍ය සපයා ගත යුතු වේ. පරිගණක ග්‍රැෆික් නිර්මාණ, වර්ණ මුද්‍රිත **A4 ප්‍රමාණයේ** කඩදාසියක විය යුතු ය.

2.3 මූර්ති නිර්මාණ තරග ශීර්ෂ සඳහා ඇඹීම හා එකලස් කිරීමේ නිර්මාණ අඩි 1×1×1 ප්‍රමාණයෙන් යුක්ත විය යුතු අතර නෙළීමේ නිර්මාණ 1×1×1 ප්‍රමාණයෙන් (පූර්ණ උන්නත) හෝ 1×1 ප්‍රමාණයෙන් (අධි උන්නත, අර්ධ උන්නත, අල්ප උන්නත) යුක්ත විය යුතු ය. එසේම එම තරග ශීර්ෂ සඳහා ඉදිරිපත් වන්නන් ඊට අදාළ ද්‍රව්‍ය තමන් විසින් ම සපයා ගැනීම කළ යුතු වේ. මෙම නිර්මාණ තරග ශීර්ෂ සඳහා **විද්‍යුත් උපකරණ භාවිතයට අවසර නැත.**

2.4 සමස්ත ලංකා චිත්‍ර තරගය සඳහා ඇතුළත් ව ඇති සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම, සාම්ප්‍රදායික බිතුසිතුවම් සැරසිලි ඒකක බලා ඇඳීම හා උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය චිත්‍ර) [ශීර්ෂ අංක 18, 43, 52, 53, 54, 55] සඳහා පාසල් හා කලාප මට්ටමේ දී තමන්ට අභිමත මුද්‍රිත පිටපතක් හෝ ඡායාරූපයක් බලා ඇඳීමට ඉඩ ලබා දෙන අතර, පළාත් විනිශ්චයෙන් පසු ජාතික මට්ටමේ අවසන් තරගයේ දී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබා දෙන මුද්‍රිත පිටපතක් ඇසුරෙන් සිතුවම් ඇඳීමට යොමු කෙරේ.

2.5 ජාතික මට්ටමේ අවසන් අදියරේ දී සෑම තරග ශීර්ෂයක් සඳහා ම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මාතෘකා සැපයේ.

2.6 කලාප තරගයේ දී, කලාප අධ්‍යාපන කාර්යාලය මගින් කැඳවා චිත්‍ර /නිර්මාණ සිදු කරන අවස්ථාවේ දී සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කැඳවා අවසාන වටයට චිත්‍ර / නිර්මාණ සිදු කරන අවස්ථාවේ දී ලබා දෙන තරග කාලය, පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා වේ.

2.7 මෙවර පටන් ආරම්භ වන මූර්ති නිර්මාණ තරගය (ශීර්ෂ අංක 36,37,38, 66, 67 සහ 68) විශේෂ තරග අංශයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා අයදුම් කරන්නන් සෘජුව ම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අයදුම් කළ යුතු අතර, ඒ සඳහා මේ සමග අවසානයට ඇති ඇමුණුම 04 හි ආදර්ශ අයදුම්පත භාවිත කළ යුතු ය.

2.8 මූර්ති නිර්මාණ ඉදිරිපත් කිරීමේ විශේෂ තරග අංශයේ දී, පළමුව තමන් ඉදිරිපත් වන තරග අංශයට අදාළ නිර්මාණයක් පාසලේ දී සිදු කර එහි ඉදිරිපස සහ දෙපස පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි ආකාරයෙන් ලබාගත් ඡායාරූප අවම වශයෙන් 3ක් විදුහල්පති විසින් සහතික කර, මෙහි ඇමුණුම 04 හි අයදුම්පත සමග 2025 ජූනි මස 30 වන දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඇමුණුම 04 අයදුම්පතේ පිටපත් තම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සෞන්දර්ය / චිත්‍ර විෂය භාර අධ්‍යක්ෂ වෙත ද යැවිය යුතු ය. ඉහත දිනයට පසුව ලැබෙන අයදුම්පත් භාර නොගන්නා අතර, පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලද අයදුම්පත පමණක් තරගයට ඇතුළත් කර ගැනේ. මෙම අයදුම්පත එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සිට 'සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය - මූර්ති අංශය' යනුවෙන් සටහන් කර එවිය යුතු ය.

**සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ,**<br>
**සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව**<br>
**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,**<br>
**ඉසුරුපාය, බත්තරමුල්ල.**

## 53 තරග සංවිධානය පිළිබඳ පොදු කරුණු

3.1 සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය අදියර 7කින් සිදු වේ. එම එක් එක් තරග සංවිධාන අදියර, සංවිධාන කාර්යය හා එය ඉටු කිරීමට නියමිත කාලය පහත වගුවෙහි පෙළ ගස්වා ඇත.

| අදියර | සංවිධාන කාර්යය | දිනය |
|---|---|---|
| 1 | පාසල්වලින් නිමවන චිත්‍ර කලාප කාර්යාලයට ලබා ගැනීම. | 2025.06.30 දිනට පෙර |
| 2 | එසේ ලද චිත්‍ර කලාප මට්ටමින් ඇගැයීමට ලක් කර එම ජයග්‍රාහකයින් කැඳවා කලාප තරගය පැවැත්වීම. | 2025.07.25 දිනට පෙර |
| 3 | කලාප තරගයේ නිර්මාණ ඇගැයීමට ලක් කර තෝරාගත් නිර්මාණ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලබා දීම. | 2025.08.15 දිනට පෙර |
| 4 | තම පළාතේ කලාපවලින් එවන ලද සියලු නිර්මාණ ඒ ඒ ශීර්ෂ අනුව ඇගැයීමට ලක් කර, අදාළ සංඛ්‍යාවන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යැවීම | 2025.09.12 දිනට පෙර |
| 5 | ඒ ඒ පළාත්වලින් ජාතික මට්ටමට එවන ලද නිර්මාණ ඇගැයීමට ලක් කර පළාත් 1, 2 සහ 3 ස්ථාන ඇතුළු ජාතික වටයට ඇතුළත් කර ගන්නා A ප්‍රමිති ශ්‍රේණියේ චිත්‍ර තේරීම. (උප අදියර කිහිපයකින් සිදු කිරීමට ඉඩ ඇත) | 2025.09.30 දිනට පෙර |
| 6 | ජාතික වටයට තෝරාගත් තරගකරුවන් සහ විශේෂ තරගයට අයදුම් කළ තරගකරුවන් කැඳවා ජාතික මට්ටමේ තරගය පැවැත්වීම. (උප අදියර කිහිපයකින් සිදු කිරීමට ඉඩ ඇත) | 2025.12. 06 දිනට පෙර |
| 7 | ජාතික මට්ටමේ තරගයට 6 අදියරේ දී සිදු කළ නිර්මාණ විනිශ්චයට ලක් කිරීම | 2025.12. 15 දිනට පෙර |

3.2 **කලාප මට්ටමින් පළාත් මට්ටමටත්, පළාත් මට්ටමෙන් ජාතික මට්ටමටත් ඉදිරිපත් කිරීමට ඒ ඒ ශීර්ෂ** අනුව තෝරා ගත යුතු නිර්මාණ සංඛ්‍යාවන් පහත වගුවෙහි දැක්වේ.

| ශ්‍රේණි | ශීර්ෂ අංක | තරග ශීර්ෂ | තෝරාගත යුතු සංඛ්‍යාව |
|---|---|---|---|
| 6 -7 | | **පින්තාරුකරණය** | |
| | 1 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය | 20 |
| | 2 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය | 10 |
| | 3 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය | 10 |
| | 4 | ප්‍රකාශන චිත්‍ර - මිශ්‍ර මාධ්‍යය | 10 |
| | 5 | මෝස්තර නිර්මාණ | 20 |
| | 6 | ග්‍රැෆික් නිර්මාණ | 20 |
| 8 -9 | 7 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය | 10 |
| | 8 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය | 10 |
| | 9 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය | 10 |
| | 10 | ප්‍රකාශන චිත්‍ර - මිශ්‍ර මාධ්‍යය | 10 |
| | 11 | මෝස්තර නිර්මාණ | 20 |
| | 12 | ග්‍රැෆික් නිර්මාණ | 20 |
| 10-11 | 13 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය | 10 |
| | 14 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය | 10 |
| | 15 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය | 10 |
| | 16 | ප්‍රකාශන චිත්‍ර -මිශ්‍ර මාධ්‍යය | 10 |
| | 17 | සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීන් ඇසුරින් ප්‍රකාශන චිත්‍ර | 10 |
| | 18 | සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම | 10 |
| | 19 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - දිය සායම් මාධ්‍යය | 10 |

| | | | |
|---|---|---|---|
| | 20 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය | 10 |
| | 21 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - කොලාජ් මාධ්‍යය | 10 |
| | 22 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - මිශ්‍ර මාධ්‍යය | 10 |
| | 23 | භූමි දර්ශන සිතුවම් - 1 | 10 |
| | 24 | උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය - ඒකවර්ණ) | 10 |
| | | **මෝස්තර** | |
| | 25 | දේශීය සාම්ප්‍රදායික සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ | 20 |
| | 26 | නව සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ | 20 |
| | 27 | නව්‍යාමය හැඩති පාරිභාරික භාණ්ඩ ඇඳීම (සැලසුම් නිර්මාණ) | 20 |
| | | **ග්‍රැෆික් නිර්මාණය (මුද්‍රිත මාධ්‍යය)** | |
| | 28 | පෝස්ටර් නිර්මාණ | 10 |
| | 29 | සන්නිදර්ශන නිර්මාණ | 10 |
| | 30 | නිෂ්පාදන ඇසුරුම්/ දවටන/ ලේබල | 10 |
| | 31 | පොත් පිටකවර | 10 |
| | 32 | චිත්‍ර කතා නිර්මාණ | 20 |
| | 33 | පුවත්පත් කාටූන් | 10 |
| | 34 | පරිගණක නිර්මාණ -1 (පෝස්ටර් නිර්මාණ, පොත් පිටකවර, නිෂ්පාදන ඇසුරුම් දවටන /ලේබල) | 10 |
| | 35 | පරිගණක නිර්මාණ -2 (සන්නිදර්ශන නිර්මාණ) | 20 |
| | | **විශේෂ තරග - මූර්ති නිර්මාණ** | |
| | 36 | ඇඹීම | 10 |
| | 37 | නෙළීම | 10 |
| | 38 | එකලස් කිරීම | 10 |
| 12 -13 | | **පින්තාරුකරණය** | |
| | 39 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය | 20 |
| | 40 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය | 10 |
| | 41 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය | 10 |
| | 42 | ප්‍රකාශන චිත්‍ර - මිශ්‍ර මාධ්‍යය | 10 |
| | 43 | සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීන් ඇසුරින් ප්‍රකාශන චිත්‍ර | |
| | 44 | සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම | |
| | 45 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - දිය සායම් මාධ්‍යය | 10 |
| | 46 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය | 10 |
| | 47 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - කොලාජ් මාධ්‍යය | 10 |
| | 48 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - මිශ්‍ර මාධ්‍යය | 10 |
| | 49 | නිශ්චල ද්‍රව්‍ය සංරචනය | 10 |
| | 50 | භූමි දර්ශන සිතුවම් -1 | 05 |
| | 51 | භූමි දර්ශන සිතුවම් -2 | 10 |
| | 52 | උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය - ඒකවර්ණ) | 10 |
| | 53 | උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය - බහුවර්ණ) | 10 |
| | | **මෝස්තර** | |
| | 54 | සාම්ප්‍රදායික බිතුසිතුවම් සැරසිලි ඒකක බලා ඇඳීම | 15 |
| | 55 | සාම්ප්‍රදායික සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ | 15 |
| | 56 | නව සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ | 15 |
| | 57 | නව්‍යාමය හැඩති පාරිභාරික භාණ්ඩ ඇඳීම (සැලසුම් නිර්මාණ) | 15 |
| | | **ග්‍රැෆික් නිර්මාණය (මුද්‍රිත මාධ්‍යය)** | |
| | 58 | පෝස්ටර් නිර්මාණ | 10 |
| | 59 | සන්නිදර්ශන නිර්මාණ | 10 |
| | 60 | පොත් පිටකවර | 10 |

| | | | |
|---|---|---|---|
| | 61 | නිෂ්පාදන ඇසුරුම්/ දවටන/ ලේබල | 10 |
| | 62 | චිත්‍ර කතා නිර්මාණ | 05 |
| | 63 | පුවත්පත් කාටූන් | 10 |
| | 64 | පරිගණක නිර්මාණ -1 (පෝස්ටර් නිර්මාණ, පොත් පිටකවර, නිෂ්පාදන ඇසුරුම් දවටන /ලේබල) | 10 |
| | 65 | පරිගණක නිර්මාණ -2 (සත්නිදර්ශන නිර්මාණ) | 05 |
| | | **විශේෂ තරග - මූර්ති නිර්මාණ** | |
| | 66 | ඇඹීම | ජාතික මට්ටමින් පමණක් ඇගැයීමට ලක් කෙරේ |
| | 67 | නෙළීම | |
| | 68 | එකලස් කිරීම | |

## 4 කලාප මට්ටමේ සංවිධාන කටයුතු හා කලාප තරග විනිශ්චය

4.1 පාසල් මඟින් කලාප අධ්‍යාපන කාර්යාලයට යොමු කරන නිර්මාණ පිටුපස, මෙම චක්‍රලේඛය අවසානයට ඇති ඇමුණුම - 02 හි ඇති අයදුම් පත්‍රය ඇලවීම හා එහි විදුහල්පතිගේ නිල මුද්‍රාව සහිතව අත්සන් තැබීම අනිවාර්ය වේ.

4.2 පාසල් මට්ටමින් කලාපයට එවූ නිර්මාණ, කලාප සෞන්දර්ය හෝ චිත්‍ර විෂය සම්බන්ධ නිලධාරීන්ගේ නිර්දේශය මත චිත්‍ර විෂය අධක්ෂවරුන් හෝ චිත්‍ර විෂය ගුරු උපදේශකවරුන් හෝ, විෂය ප්‍රවීණයන් තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් පත් කර කලාප මට්ටමේ චිත්‍ර නිර්මාණය සඳහා සුදුසු තරගකරුවන් තෝරා ගත යුතු වේ. (මේ සඳහා පාසල් ගුරුභවතුන් යොදා නොගත යුතු ය).

4.3 එසේ තෝරාගත් තරගකරුවන් කලාපයේ එක් ස්ථානයකට කැඳවා එදින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා කාලය අතරතුර ඔවුන් ඉදිරිපත් වන ශීර්ෂයන්ට අදාළ නිර්මාණ සිදු කළ යුතු අතර එම නිර්මාණ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන සහ නිල මුද්‍රාව සහිතව තම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ය සෞන්දර්ය හෝ චිත්‍ර විෂය සම්බන්ධ නිලධාරීන්ගේ නිර්දේශය මත චිත්‍ර විෂය අධක්ෂවරුන් හෝ චිත්‍ර විෂය ගුරු උපදේශකවරුන් හෝ, පාසල් ගුරුවරුන් නොවන විෂය ප්‍රවීණයන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් මගින් ඇගැයීමට ලක් කර, පළාත් මට්ටමට යැවීමට සුදුසු නිර්මාණය තෝරා ගත යුතු ය.

4.4 කලාප තරග විනිශ්චය පිළිබඳ පූර්ණ වගකීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරේ. මෙම චක්‍රලේඛයේ කොන්දේසි ඉක්මවා නොයන පරිදි කලාප තරග ප්‍රතිඵලවල අවසන් තීරක වන්නේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වේ.

4.5 මෙම චක්‍රලේඛයෙහි අංක 3 කොටසෙහි වගුවෙහි සඳහන් අනුස්මරණ සම්මාන හැර 1, 2, 3 ස්ථාන සඳහා සහ නියමිත කුසලතා සංඛ්‍යාව සඳහා සහතිකපත් කලාප කාර්යාලය මගින් ලබා දිය යුතු ය. කලාපය විසින් සිදුකරන විනිශ්චයන් හා එම ජයග්‍රහණ පළාත් හා ජාතික මට්ටමට අදාළ නොවන අතර එය කලාප ජයග්‍රහණයන් ලෙස පමණක් සැලකිය යුතු වේ.

4.6 කලාපීය ප්‍රතිඵල ලේඛන සකස් කිරීමේ දී අදාළ ජයග්‍රාහකයින්ගේ නාම ලේඛනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර ජයග්‍රාහී නිර්මාණ සමඟ තම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය.

4.7 කලාපයේ ජයග්‍රාහී නිර්මාණ පළාතට යැවීමට පෙර සෑම චිත්‍රයකම පිටුපස, මෙහි අවසානයට ඇති ඇමුණුම - 03 දරන අයදුම් පත්‍රය ඇලවිය යුතු අතර එහි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සඳහා වෙන් කර ඇති ස්ථානයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ කලාපයේ චිත්‍ර විෂය භාර අධ්‍යක්ෂගේ අත්සන තබා නිල මුද්‍රාව සටහන් කිරීම අනිවාර්ය වේ.

## 5 පළාත් මට්ටමේ සංවිධාන කටයුතු සහ පළාත් තරග විනිශ්චය

5.1 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ උපදෙස් මත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සෞන්දර්ය / චිත්‍ර විෂයභාර අධ්‍යක්ෂ, තම පළාතේ සෑම අධ්‍යාපන කලාපයකින් ම ඇඳීම සිදු කිරීමෙන් අනතුරුව තෝරා තමන් වෙත එවන චිත්‍ර අතරින්, ජාතික මට්ටමට යැවීමට සුදුසු නිර්මාණ තෝරා ගැනීම සඳහා පළාත් විනිශ්චය කටයුතු සංවිධානය කළ යුතු වේ. පළාත් මට්ටමින් ජාතික මට්ටමට, ඉහත 3.3 ට අයත් වගුවේ ඒ ඒ ශීර්ෂයන්ට අදාළව සටහන් කර ඇති සංඛ්‍යාව පමණක් ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයකින් තේරීම සිදු

කළ යුතු වේ. මෙම චිත්‍ර තෝරා ගැනීමේ දී, පහත 6.3 හි සඳහන් කර ඇති A සහ B ප්‍රමිති මට්ටම්වලට අයත්වන නිර්මාණ අතරින් පමණක් එය සිදු කළ යුතු අතර, එම ජයග්‍රාහී නිර්මාණ, අදාළ නාමලේඛන ද සමග අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය. මෙහි දී ඒ ඒ ශීර්ෂවල 1, 2 සහ 3 ස්ථාන තේරීමක් සිදු නොකළ යුතු වේ.

5.2 පළාත් මට්ටමින් ජාතික මට්ටමට චිත්‍ර එවීමේ දී, එම චිත්‍රයහි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අත්සන් කර අලවා ඇති, මෙහි අවසානයට ඇති ඇමුණුම - 03 දරන අයදුම් පත්‍රයේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සඳහා වෙන් කර ඇති ස්ථානයේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ පළාතේ චිත්‍ර විෂය භාර අධ්‍යක්ෂගේ අත්සන තබා නිල මුද්‍රාව සටහන් කිරීම අනිවාර්ය වේ.

5.3 අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කෙරෙන ජාතික තලයේ විනිශ්චය මණ්ඩලයකින් ඒ ඒ පළාතෙන් ඒ ඒ ශීර්ෂයන්ට අදාළව ප්‍රථම දෙවන සහ තෙවන ස්ථානයන් තෝරා ගැනේ. එහි දී පළාත් ප්‍රතිඵල සහ කිසියම් නිර්මාණයක් පෙර වර්ෂයක ජයග්‍රාහී නිර්මාණයකට සමාන වීම, මාධ්‍ය භාවිතයේ හා නම් කිරීමේ ගැටලු වැනි අවස්ථාවල අවසන් තීරණය, ඉහත විනිශ්චය මණ්ඩලය සතු වේ.

5.4 ඒ ඒ පළාත් මට්ටමින් ජාතික මට්ටමට එවන ලද නිර්මාණ අතරින් පහත 6.3 හි සඳහන් A ප්‍රමිති ශ්‍රේණියට අයත් නිර්මාණ, අමාත්‍යාංශයීය විනිශ්චය මණ්ඩලයෙන් ජාතික මට්ටමේ තරගය සඳහා තෝරා ගැනේ.

5.5 අමාත්‍යාංශයීය විනිශ්චය මණ්ඩලයෙන් තෝරාගත් පළාත් මට්ටමේ 1, 2 සහ 3 ස්ථාන සඳහා සහතිකපත් සහ එම 1, 2 සහ 3 ස්ථානවලට නොතේරුණු එහෙත් ජාතික මට්ටමේ තරගයට පළාතෙන් තෝරා එවූ ඉතිරි සියලු නිර්මාණ සඳහා කුසලතා සහතිකපත් ලබා දීම ඒ ඒ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ය.

## 6 ජාතික මට්ටමේ සංවිධාන කටයුතු සහ ජාතික තරග විනිශ්චය

6.1 ඒ ඒ ශීර්ෂවලින් පළාත් මට්ටම්වලින් තෝරාගත් A ප්‍රමිති ශ්‍රේණියට අයත් නිර්මාණ ඉදිරිපත් කළ තරගකරුවන් සහ විශේෂ තරග අංශයට ඍජුව සම්බන්ධ වන තරගකරුවන් කැඳවා මෙම අදියර ක්‍රියාත්මක කෙරේ. මෙහි දී ශීර්ෂ අංක 36, 37, 38, 66, 67 සහ 68 යන විශේෂ අංශයේ තරගකරුවෙකුට අංක ඔහු හෝ ඇය අයත් වන වෙනත් ශීර්ෂයකට සහභාගී වීමට සිදු වුවහොත්, විශේෂ තරගය සඳහා වෙනත් අවස්ථාවක් ලබා දේ.

6.2 ජාතික මට්ටමේ විනිශ්චය කටයුතු, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කෙරෙන ඇගැයීම් මණ්ඩලයකින් සිදු කෙරේ. මෙම කටයුත්ත නිරීක්ෂණය සඳහා ඒ ඒ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සෞන්දර්ය/චිත්‍ර විෂය භාර අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් බලය පැවරූ වෙනත් නිලධාරිවරයකු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් යොමු කළ යුතු ය.

6.3 පළාත් සහ ජාතික මට්ටමේ නිර්මාණ ඇගැයීම පහත රුබ්රික් සටහන පාදකව සිදු කළ යුතු අතර, අවශ්‍ය නම් මෙම ක්‍රමවේදය කලාප මට්ටම් සඳහා ද අදාළ කර ගත හැකි ය.

| ශ්‍රේණි | ලකුණු | විස්තරය |
|---|---|---|
| **A** | 75-100 | විෂය පිළිබඳ විශිෂ්ට කාර්ය සාධනයක් පෙන්වයි. එනම් දෘශ්‍ය කලාවට අයත් මූලිකාංග, මූලධර්ම, ශෛලීන්, සංකල්ප, මාධ්‍ය හා ශිල්ප ක්‍රම ඇසුරෙන් ඉහළ දැනුමක් සහිත කුසලතාවක් පෙන්වයි. ස්වයං ප්‍රකාශන ශක්තිය සමග පෞද්ගලික හා සමාජීය ලක්ෂණ පෙන්වයි. |
| **B** | 50-74 | විෂය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා කුසලතාවක් ඇති අතර එම දැනුම හා කුසලතාව දැඩි අවබෝධයෙන් යුතුව හසුරුවයි. සීමිත හා ස්වාධීන ප්‍රකාශන ශක්තියක් පෙන්වයි. |
| **C** | 0-49 | විෂය පිළිබඳ යම් දැනුමක් සහ හැකියාවක් ඇත. ශ්‍රේණි මට්ටමේ අපේක්ෂාවන් සුළු වශයෙන් ඉදිරිපත් කර ඇත. |

## 7 ජයග්‍රහණ සඳහා සම්මාන සහතිකපත් ලබා දීම

7.1 තරග ශීර්ෂ 68 ක් සඳහා ජාතික විනිශ්චය අනුව තෝරා ගැනීමට අපේක්ෂිත 6 - 13 ශ්‍රේණි සඳහා ජයග්‍රහණ පහත වගුවෙන් දැක්වේ. මෙම ජයග්‍රහණයන්, ඉහත 6.3 හි A ප්‍රමිති ශ්‍රේණියේ නිර්මාණ සඳහා පමණක් ප්‍රදානය කෙරේ.

| ශ්‍රේණි | ශීර්ෂ අංකය | තරග ශීර්ෂ | ප්‍රථම | දෙවන | තෙවන | ප්‍රශංසනීය සම්මාන | කුසලතා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 6 - 7 | | **පින්තාරුකරණය** | | | | | | |
| | 1 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 2 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 3 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 4 | ප්‍රකාශන චිත්‍ර - මිශ්‍ර මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 5 | මෝස්තර නිර්මාණ | 1 | 1 | 1 | 2 | 15 | 20 |
| | 6 | ග්‍රැෆික් නිර්මාණ | 1 | 1 | 1 | 2 | 15 | 20 |
| 8 - 9 | 7 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 8 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 9 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 10 | ප්‍රකාශන චිත්‍ර - මිශ්‍ර මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 11 | මෝස්තර නිර්මාණ | 1 | 1 | 1 | 2 | 15 | 20 |
| | 12 | ග්‍රැෆික් නිර්මාණ | 1 | 1 | 1 | 2 | 15 | 20 |
| 10 - 11 | | **පින්තාරුකරණය** | | | | | | |
| | 13 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 14 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 15 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 16 | ප්‍රකාශන චිත්‍ර -මිශ්‍ර මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 17 | සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීන් ඇසුරින් ප්‍රකාශන චිත්‍ර | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 18 | සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 19 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - දිය සායම් මාධ්‍ය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 20 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍ය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 21 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - කොලාජ් මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 22 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය - මිශ්‍ර මාධ්‍ය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 23 | භූමි දර්ශන සිතුවම් - 1 | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 24 | උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය - ඒකවර්ණ) | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | | **මෝස්තර** | | | | | | |
| | 25 | දේශීය සාම්ප්‍රදායික සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ | 1 | 1 | 1 | 2 | 15 | 20 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 26 | නව සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ | 1 | 1 | 1 | 2 | 15 | 20 |
| | 27 | නව්‍යාමය හැඩති පාරිභාරික භාණ්ඩ ඇඳීම (සැලසුම් නිර්මාණ) | 1 | 1 | 1 | 2 | 15 | 20 |
| | | **ග්‍රැෆික් නිර්මාණය (මුද්‍රිත මාධ්‍යය)** | | | | | | |
| | 28 | පෝස්ටර් නිර්මාණ | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 29 | සන්නිදර්ශන නිර්මාණ | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 30 | නිෂ්පාදන ඇසුරුම්/ දවටන/ ලේබල | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 31 | පොත් පිටකවර | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 32 | චිත්‍ර කතා නිර්මාණ | 1 | 1 | 1 | 2 | | 05 |
| | 33 | පුවත්පත් කාටූන් | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 34 | පරිගණක නිර්මාණ -1 (පෝස්ටර් නිර්මාණ, පොත් පිටකවර, නිෂ්පාදන ඇසුරුම් දවටන /ලේබල) | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 35 | පරිගණක නිර්මාණ -2 (සන්නිදර්ශන නිර්මාණ) | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | | **විශේෂ තරග - මූර්ති නිර්මාණ** | | | | | | |
| | 36 | ඇඹීම (ජාතික වටය පමණි) | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 37 | නෙළීම (ජාතික වටය පමණි) | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 38 | එකලස් කිරීම (ජාතික වටය පමණි) | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| 12 -13 | | **පින්තාරුකරණය** | | | | | | |
| | 39 | ප්‍රකාශන චිත්‍ර - දිය සායම් මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 40 | ප්‍රකාශන චිත්‍ර - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 41 | ප්‍රකාශන චිත්‍ර - කොලාජ් මාධ්‍යය මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 42 | ප්‍රකාශන චිත්‍ර - මිශ්‍ර මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 43 | සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 44 | සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීන් ඇසුරින් ප්‍රකාශන චිත්‍ර | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 45 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - දිය සායම් මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 46 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 47 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - කොලාජ් මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 48 | නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය (බලා ඇඳීම) - මිශ්‍ර මාධ්‍යය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 49 | නිශ්චල ද්‍රව්‍ය සංරචනය | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 50 | භූමි දර්ශන සිතුවම් -1 | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 51 | භූමි දර්ශන සිතුවම් -2 | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 52 | උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය - ඒකවර්ණ) | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 53 | උඩුකය ප්‍රතිරූප චිත්‍ර (ආලේඛ්‍ය - බහුවර්ණ) | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | | **මෝස්තර** | | | | | | |
| | 54 | සාම්ප්‍රදායික බිතුසිතුවම් සැරසිලි ඒකක බලා ඇඳීම | 1 | 1 | 1 | 2 | 15 | 20 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 55 | සාම්ප්‍රදායික සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ | 1 | 1 | 1 | 2 | 15 | 20 |
| | 56 | නව සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ | 1 | 1 | 1 | 2 | 15 | 20 |
| | 57 | නව්‍යමය හැඩති පාරිභාරික භාණ්ඩ ඇඳීම (සැලසුම් නිර්මාණ) | 1 | 1 | 1 | 2 | 15 | 20 |
| | **ග්‍රැෆික් නිර්මාණය (මුද්‍රිත මාධ්‍යය)** | | | | | | | |
| | 58 | පෝස්ටර් නිර්මාණ | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 59 | සන්නිදර්ශන නිර්මාණ | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 60 | පොත් පිටකවර | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 61 | නිෂ්පාදන ඇසුරුම්/ දවටන/ ලේබල | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 62 | චිත්‍ර කතා නිර්මාණ | 1 | 1 | 1 | 2 | | 05 |
| | 63 | පුවත්පත් කාටූන් | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 64 | පරිගණක නිර්මාණ -1 (පෝස්ටර් නිර්මාණ, පොත් පිටකවර, නිෂ්පාදන ඇසුරුම් දවටන /ලේබල) | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 65 | පරිගණක නිර්මාණ -2 (සන්නිදර්ශන නිර්මාණ) | 1 | 1 | 1 | 2 | | 05 |
| | **විශේෂ තරග - මූර්ති නිර්මාණ** | | | | | | | |
| | 66 | ඇඹීම (ජාතික වටය පමණි) | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 67 | නෙළීම (ජාතික වටය පමණි) | 1 | 1 | 1 | 2 | 5 | 10 |
| | 68 | එකලස් කිරීම (ජාතික වටය පමණි) | 1 | 1 | 1 | 2 | 5 | 10 |

7.2 ජාතික මට්ටමේ ජයග්‍රාහකයන්ට ලබා දෙන අනුස්මරණ සම්මාන පහත පරිදි වේ.

පින්තාරුකරණය සඳහා - ජෝර්ජ් කීට් අනුස්මරණ සම්මානය.

මෝස්තර නිර්මාණකරණය සඳහා - එල්.ටී.පී.මංජුශ්‍රී අනුස්මරණ සම්මානය.

ග්‍රැෆික් නිර්මාණකරණය සඳහා - සෝලියස් මෙන්ඩිස් අනුස්මරණ සම්මානය.

මූර්ති නිර්මාණකරණය සඳහා - තිස්ස රණසිංහ අනුස්මරණ සම්මානය.

7.3 පළාත් මට්ටමින් ඒ ඒ ශීර්ෂයෙන් ජාතික මට්ටමට තෝරා එවන ලද චිත්‍ර අතරින් ඉහත 7.1 කොටසට අයත් වගුවෙහි සම්මාන සහ කුසලතා සහතික නොලද සියලු ම තරගකරුවන්ට ජාතික මට්ටමේ සහභාගීත්ව සහතිකයක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පිරිනැමේ.

# ඇමුණුම - 01

## චිත්‍ර තරඟ ශීර්ෂ, නිර්ණායක සහ මාධ්‍ය වර්ගීකරණය

### චිත්‍ර තරඟ ශීර්ෂ පිළිබඳ විස්තර සහ ඇගැයීමේ නිර්ණායක

මෙම තරඟයට අයත් වන තරඟ ශීර්ෂ 68ට අදාළ පොදු ගුණාංග සහ එම නිර්මාණ ඇගැයීමේ දී පදනම් විය යුතු නිර්ණායක පිළිබඳ විස්තර පහත දැක්වේ.

**ප්‍රකාශන චිත්‍ර**

6 සිට 13 ශ්‍රේණි දක්වා මෙම තරඟ ශීර්ෂය විවෘත ය. ප්‍රකාශන චිත්‍ර නිර්මාණය දිය සායම් මාධ්‍යය, පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය, මිශ්‍ර මාධ්‍ය හා කොලාජ් මාධ්‍යය යන අංශ යටතේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. 10 - 11 ශ්‍රේණි හා 12- 13 ශ්‍රේණි සඳහා වන නූතන චිත්‍ර කලා ශෛලීන් ඇසුරෙන් නිමවන ප්‍රකාශන චිත්‍ර නිර්මාණ ලෙස හඳුන්වනු ලබන්නේ උපස්ථිතිවාදි නිර්මාණ ශෛලියෙන් පසු බිහිවන විවිධ ශෛලීන් ඇසුරෙන් සිදු කරන නිර්මාණයන් ය. ප්‍රකාශන චිත්‍ර වර්ගීකරණයට අයත් සියලු ම තරඟ ශීර්ෂ සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

**නිර්ණායක** :

- මාතෘකාවට උචිත වාතාවරණය හා පරිසරය දැක්වීම.
- අවකාශය මත රූප සංරචනය කර ඇති ආකාරය.
- ශෛලියට අදාළ සිද්ධාන්ත භාවිතය.
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- භාව ප්‍රකාශනය හා ප්‍රශස්ත නිමාව.

**සාම්ප්‍රදායික චිත්‍ර සිතුවම් කිරීම**

10 -11 හා 12-13 ශ්‍රේණි සඳහා මෙම තරඟ ශීර්ෂය විවෘත ය. මහනුවර උඩරට හා පහතරට බිතු සිතුවම් සහ ඉන්දියාවේ මෝගල් රාජ්පුට් සහ තාන්ජවූර් සිතුවම් බලා ඇඳීම මින් අපේක්ෂිත ය. ට්‍රේසින් කඩදාසි සමඟ අඳිමින් සිදු කරන පිටපත් කිරීමේ ක්‍රියාවලිය මේ සඳහා භාවිත නොකළ යුතු ය. සම්ප්‍රදායික සිතුවම් කොටසක් සහිත ඡායාරූපයක් නිරීක්ෂණයෙන් පමණක් එහි ගතිලක්ෂණ බලා ඇඳීමට අවස්ථාව සැලසේ. මෙම නිර්මාණ ඇගැයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

නිර්ණායක :

- මුල් නිර්මාණයට අයත් ලක්ෂණ, වාතාවරණය හා පරිසරය දැක්වීම.
- අවකාශය මත රූප සංරචනය කිරීම.
- ශෛලියට අදාළ සිද්ධාන්ත භාවිතය.
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- ප්‍රශස්ත සියුම් නිමාව.

**සාම්ප්‍රදායික චිත්‍ර ශෛලීන් ඇසුරින් ප්‍රකාශන චිත්‍ර**

10-11 හා 12-13 ශ්‍රේණි සඳහා මෙම තරඟ ශීර්ෂය විවෘත ය. ඉපැරණි සම්ප්‍රදායන් ඇසුරු කරමින් සිදු කරන ප්‍රකාශන චිත්‍ර මීට අයත් ය. (උදා :- අනුරාධපුර හා පොළොන්නරු යුගයේ සිතුවම්, මහනුවර සිතුවම් සම්ප්‍රදායන් සහ මෝගල්, රාජ්පුට් සහ තාන්ජවූර් සම්ප්‍රදායන් මෙන් ම, ඊජිප්තු හා ග්‍රීක සිතුවම් ලක්ෂණ ඇසුරින් සකස් කරගත් ප්‍රකාශන). මෙම නිර්මාණ ඇගැයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

නිර්ණායක :

- මාතෘකාවට උචිත වාතාවරණය හා පරිසරය දැක්වීම.
- අවකාශය මත රූප සාර්ථකව සංරචනය කිරීම.
- ශෛලියට අදාළ සිද්ධාන්ත භාවිතය.
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- නව්‍යතාව හා ප්‍රශස්ත සියුම් නිමාව.

**නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය**

10-11 සහ 12-13 ශ්‍රේණිවල සිසුන් සඳහා විවෘත ය. මෙම තරග ශීර්ෂය දිය සායම් මාධ්‍යය, පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය, මිශ්‍ර මාධ්‍ය හා කොලාජ් මාධ්‍යය යන අංශ යටතේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. එහි දී තරගකරුවන්ට සපයන ද්‍රව්‍ය සමූහය ඒ ආකාරයෙන් ම බලා ඇඳීම අපේක්ෂිත අතර ඇගැයීම සඳහා පහත නිර්ණායක පදනම් කර ගැනේ.

නිර්ණායක :

- ද්‍රව්‍ය සමූහය අර්ථවත්ව තලය මත සම්පිණ්ඩනය කිරීම.
- පරිමාණානුකූලව ද්‍රව්‍ය නිරූපණය හා ගති ලක්ෂණ දැක්වීම.
- සිද්ධාන්ත භාවිතය (පර්යාලෝකය, ත්‍රිමාණත්වය හා ඇස් මට්ටම).
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- පසුතලය හා සමස්ත නිමාව.

**නිශ්චල ද්‍රව්‍ය සංරචනය**

12-13 ශ්‍රේණිවල සිසුන් සඳහා මෙම තරග ශීර්ෂය ඉදිරිපත් කෙරේ. මෙහිදි සපයන ලද ද්‍රව්‍ය සමූහය වෙනස් ආකාරයකින් ප්‍රකාශනාත්මක ව සංරචනය කිරීමට අවස්ථාව සැලසේ. ඒ සඳහා උපස්ථිතිවාදී, පශ්චාත් උපස්ථිතිවාදී සහ ඝනිකවාදී කලා ශෛලීන්වල ආභාසයන් දැක්විය හැකි වේ. මෙම නිර්මාණ ශීර්ෂය අභිමත මාධ්‍යයකින් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසෙන අතර එම නිර්මාණ ඇගැයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

නිර්ණායක :

- ද්‍රව්‍ය සමූහය අර්ථවත්ව තලය මත සංරචනය කිරීම.
- පරිමාණානුකූලව ද්‍රව්‍ය නිරූපණය හා ගති ලක්ෂණ දැක්වීම.
- ශෛලියට අදාළ සිද්ධාන්ත භාවිතය.
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- නව්‍යතාව හා ප්‍රශස්ත නිමාව.

**භූමි දර්ශන සිතුවම් -1**

මෙම භූමි දර්ශන සිතුවම් අංශය 10-11 සහ 12-13 ශ්‍රේණිවල සිසුන් සඳහා විවෘත ය. මෙහිදි භූමි දර්ශන ඒ ආකාරයෙන්ම ඇඳීම හා සිතුවම් කිරීම සිදු කල යුතු වේ. ඒ අනුව දක්නට ලැබෙන භූමි දර්ශනයේ වර්ණ, රේඛා සහ හැඩතල සම්මත ශාස්ත්‍රාලයීය චිත්‍ර සිද්ධාන්තයන්ට අනුකූලව ඉදිරිපත් කිරීම කළ යුතු වේ. ඒ සඳහා අභිමත දිය සායම් මාධ්‍යයක්, පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යයක් භාවිත කිරීමට අවස්ථාව ඇති අතර, ඇගැයීම සඳහා පහත නිර්ණායක පදනම් කර ගැනේ.

නිර්ණායක :

- තෝරාගත් දර්ශනය සාර්ථකව තලය මත සංවිධානය කිරීම.
- පරිමාණානුකූලව හැඩතල නිරූපණය හා ගති ලක්ෂණ දැක්වීම
- පර්යාලෝකය හා ඇස් මට්ටම දැක්වීම.
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- සමස්ථය දැක්වීම හා ප්‍රශස්ත නිමාව.

**භූමි දර්ශන සිතුවම් - 2**

මෙම තරග ශීර්ෂය 12 හා 13 ශ්‍රේණි සඳහා විවෘතය. මෙහිදි භූමි දර්ශනය අභිමත පරිදි නිර්මාණාත්මකව වෙනස් කිරීමට ද අවස්ථාව සැලසේ. ඒ සඳහා දක්නට ලැබෙන භූමි දර්ශනයේ වර්ණ, රේඛා සහ හැඩතල සම්මත ශාස්ත්‍රාලයීය චිත්‍ර සිද්ධාන්තයන්ට පරිබාහිරව නූතන කලා ශෛලීන් වන උපස්ථිතිවාදි නිර්මාණ ශෛලියෙන් පසු බිහිවන විවිධ ශෛලීන්ගෙන් තමන්ට අභිමත පරිදි සිතුවම් කිරීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා අභිමත මාධ්‍යයක් භාවිත කිරීමට අවස්ථාව ඇති අතර, එම නිර්මාණ ඇගැයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

නිර්ණායක :

- තෝරාගත් භූමි දර්ශනය නිර්මාණාත්මකව තලය මත සැලසුම් කිරීම.
- හැඩතල සංරචනය හා ගති ලක්ෂණ දැක්වීම.
- ශෛලියට අදාළ සිද්ධාන්ත භාවිතය.
- වර්ණ මාධ්‍ය, ශිල්ප ක්‍රමවල උචිත බව හා කුසලතාව.
- නව්‍යතාව හා ප්‍රශස්ත නිමාව.

**උඩුකය ප්‍රතිරූප චිත්‍ර - ආලේඛ්‍ය**

10-11 සහ 12-13 ශ්‍රේණිවල සිසුන් සඳහා ප්‍රතිරූප ඇඳීමේ චිත්‍ර අංශය විවෘත ය. 10-11 ශ්‍රේණි සඳහා එක් තරග ශීර්ෂයක් වන අතර ඒ සඳහා ඒකවර්ණ මාධ්‍යය භාවිත කළ හැකි ය. 12-13 ශ්‍රේණි සඳහා ඒකවර්ණ හා බහුවර්ණ මාධ්‍යය පදනම් කර තරග ශීර්ෂ දෙකකින් නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. එම නිර්මාණ ඇගැයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

නිර්ණායක :

- චරිත හා ගති ලක්ෂණ දැක්වීම.
- පරිමාණුකූල සංරචනය කිරීම.
- ත්‍රිමාණ බව හා සියුම් ලක්ෂණ දැක්වීම.
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- සමස්ත ප්‍රශස්ත නිමාව.

**මෝස්තර නිර්මාණ**

6 සිට 13 ශ්‍රේණි සඳහා මෙම තරග ශීර්ෂය විවෘත ය. 6 සිට 9 ශ්‍රේණි දක්වා පොදුවේ ද, 10 -11 ශ්‍රේණි සඳහා පහත අංක 1 සිට 3 දක්වා වන මෝස්තර නිර්මාණ කොටස් ද, 12-13 ශ්‍රේණි සඳහා පහත අංක 1 සිට 4 දක්වා වන කොටස් ද යටතේ මෙම තරගය පැවැත් වේ.

i. සාම්ප්‍රදායික සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ

සාම්ප්‍රදායික සැරසිලි ඒකක / සම්ප්‍රදායික සැරසිලිවල මූලික ලක්ෂණ භාවිත කරමින් ව්‍යාප්ත සැරසිලි, මුළුතල සැරසිලි තිරු සැරසිලි, ධජ පතාක සහ බිත්ති සැරසිලි වැනි සැරසිලි මෝස්තර නිර්මාණය කිරීම අපේක්ෂිත ය.

ii. නව සැරසිලි ඒකක ඇසුරෙන් මෝස්තර නිර්මාණ

සම්ප්‍රදායික සැරසිලි ඒකක සහ ඒවායේ මූලික ලක්ෂණවලින් බැහැරව නව්‍ය වූ සැරසිලි ඒකක ඇසුරෙන් ව්‍යාප්ත සැරසිලි මුළුතල සැරසිලි, තිරු සැරසිලි, ධජ පතාක සහ බිත්ති සැරසිලි වැනි සැරසිලි මෝස්තර නිර්මාණය කිරීම අපේක්ෂිත ය.

iii. නව්‍යමය හැඩති පාරිභාරික භාණ්ඩ ඇඳීම (සැලසුම් නිර්මාණ)

නව්‍යමය හැඩති පාරිභාරික භාණ්ඩ සඳහා ත්‍රිමාණ නිර්මාණ (සැලසුම් නිර්මාණ) ඇඳීම අපේක්ෂා කෙරෙන අතර එහි දී එම භාණ්ඩවල ඉදිරි පෙනුම පමණක් ඇඳීම ප්‍රමාණවත් වේ. එම ත්‍රිමාණ හැඩ මතුපිට අලංකරණය සඳහා සැරසිලි මෝස්තර ද භාවිත කළ හැකි වේ.

මෙම මෝස්තර තරග ශීර්ෂ නිර්මාණ ඇගැයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

නිර්ණායක :

- නිර්මාණ කාර්යයට උචිත අයුරින් නව්‍යතාවකින් සැලසුම් කිරීම.
- පාරිභාරික අවශ්‍යතාවලට ගැළපෙන බව හා කර්මාන්තයට උචිත බව.
- රේඛා සහ හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව.
- උචිත වර්ණ තෝරා ගැනීම හා මාධ්‍ය භාවිත කිරීමේ කුසලතාව.
- විචිත්‍රත්වය, සියුම් නිර්මාණකරණය හා සාර්ථක නිමාව.

**සාම්ප්‍රදායික බිතුසිතුවම් සැරසිලි ඒකක බලා ඇඳීම**

ශ්‍රී ලාංකේය හා ඉන්දියානු සම්ප්‍රදායික බිතුසිතුවම් ආශ්‍රිත ව දැකිය හැකි සාම්ප්‍රදායික සැරසිලි වර්ගීකරණයට අයත් ජ්‍යාමිතික, උද්භිද, නිරූඝ, අර්ධ නිරූඝ වැනි සැරසිලි ඒකක/ මෝස්තර බලා ඇඳීමට අවස්ථාව සැලසේ මෙහි දී අපේක්ෂා කෙරේ. ට්‍රේසින් කඩදාසි සමඟ අඳිමින් සිදු කරන පිටපත් කිරීමේ ක්‍රියාවලිය මේ සඳහා භාවිත නොකළ යුතු ය. මෙම තරග ශීර්ෂවල නිර්මාණ ඇගැයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කරගනු ලැබේ.

නිර්ණායක :

- මුල් නිර්මාණයේ ගති ලක්ෂණ නිවැරදි ව දැක්වීම.
- හැඩතල සමානුපාතික හා පරිමානුකූලව යොදා ගැනීමේ හැකියාව.
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- විචිත්‍රව හා සියුම් නිර්මාණකරණය.
- ප්‍රශස්ත සමස්ත නිමාව.

**ග්‍රැෆික් නිර්මාණ**

6 සිට 13 ශ්‍රේණි දක්වා මෙම තරග ශීර්ෂය විවෘත ය. 6 – 7 සහ 8 – 9 ශ්‍රේණි සඳහා පොදුවේ ග්‍රැෆික් නිර්මාණ වශයෙන් තරගය පැවැත්වෙන අතර, 10 - 11 සහ 12 – 13 ශ්‍රේණි සඳහා පෝස්ටර් නිර්මාණ, සන්නිදර්ශන නිර්මාණ, පොත් පිටකවර නිෂ්පාදන ඇසුරුම් / දවටන /ලේබල නිර්මාණය, චිත්‍ර කතා නිර්මාණ, පුවත්පත් කාටූන් නිර්මාණ, පරිගණක නිර්මාණ -1 සහ පරිගණක නිර්මාණ - 2 ලෙස වෙන වෙන ම පැවැත්වේ.

**(i) පෝස්ටර්, සන්නිදර්ශන, පොත් පිටවර, නිෂ්පාදන ඇසුරුම් / දවටන /ලේබල නිර්මාණ**

අභිමත මාධ්‍යයකින් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසෙන මේවා ඇගැයීම පහත නිර්ණායක මත පදනම් කර ගැනේ.

නිර්ණායක :

- නිර්මාණ කාර්යය උචිත අයුරින් නව්‍යතාවකින් සැලසුම් කිරීම.
- වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැළපෙන බව කර්මාන්තයට උචිත බව.
- අක්ෂර අර්ථවත් ව යොදා ගැනීමේ හැකියාව.
- උචිත වර්ණ තෝරා ගැනීම හා මාධ්‍ය භාවිත කිරීමේ කුසලතාව.
- ආකර්ෂණය හා සාර්ථක නිමාව.

**(ii) චිත්‍ර කතා නිර්මාණ**

ඒකාංගික කතාවක් ලෙස රූප හා දෙබස් සහිතව ඉදිරිපත් කිරීම අපේක්ෂිත ය. අභිමත මාධ්‍යයකින් කළු සුදු හෝ වර්ණ වශයෙන් ඉදිරිපත් කළ හැකි ය. එම නිර්මාණ ඇගැයීම පහත නිර්ණායක මත පදනම් කර ගැනේ.

නිර්ණායක :

- අන්තර්ගත කතා විෂයට අනුකූලව චරිත නිරූපණය.
- අවකාශය මත රූප හා දෙබස් සංරචනය කිරීම.
- කතාවට අදාළ දෙබස් /අක්ෂර අර්ථවත්ව ඉදිරිපත් කිරීම.
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- සමස්ත නිමාවේ සාර්ථකත්වය හා සියුම් බව.

**(iii) කාටූන් නිර්මාණ**

අභිමත වර්ණ මාධ්‍යකින් කලු සුදු හෝ වර්ණවත්ව ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. ජාතික ආගමික දේශපාලනික හා සංස්කෘතික මෙන් ම පුද්ගල චරිතයන්ට අපහාසයක් හෝ හානියක් සිදු නොවන පරිදි නිර්මාණ ඉදිරිපත් කළ යුතු ය. එසේ නොවන නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම නිර්මාණ ඇගැයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කරගනු ලැබේ.

නිර්ණායක :

- අන්තර්ගතයට/විෂයට අනුකූලව චරිත නිරූපණය.
- අවකාශය මත රූප සංරචනය කිරීම.
- හාස්‍යය හා චරිත ලක්ෂණ අර්ථවත්ව විදහා පෑම.
- මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතයේ කුසලතාව.
- සමස්ත නිමාවේ සාර්ථකත්වය හා සියුම් බව.

**(iv) පරිගණක ග්‍රැෆික් නිර්මාණ - 1** (පෝස්ටර් නිර්මාණ, පොත් පිටකවර, නිෂ්පාදන ඇසුරුම් / දවටන /ලේබල)
**පරිගණක ග්‍රැෆික් නිර්මාණ - 2** (සන්නිදර්ශන නිර්මාණ)

පරිගණක ග්‍රැෆික් නිර්මාණ සඳහා යොදා ගන්නා මෘදුකාංග එකක් හෝ කිහිපයක් භාවිත කර පාරිභාරික භාණ්ඩයක් හෝ සන්නිවේදන කාර්යයක් සඳහා මුද්‍රණය කළ හැකි නිර්මාණයක් A4 ප්‍රමාණයට සැලසුම් කර වර්ණ මුද්‍රිත පිටපත් චිත්‍ර තරගයට ඉදිරිපත් කළ යුතු ය. කලාප මට්ටමින් තෝරාගත් සිසුන් පරිගණක විද්‍යාගාර සහිත පාසලක හෝ කලාප පරිගණක මධ්‍යස්ථානයකට කැඳවා තරග පැවැත්වීමේ දී අදාළ මධ්‍යස්ථානයේ පරිගණක යන්ත්‍ර සම්පාදනයේ සහායට සහ යම් තාක්ෂණික ගැටලුවක දී මැදිහත්වීම සඳහා පමණක් පරිගණක

විෂයය නිලධාරියෙකුගේ හෝ පරිගණක විෂයය ගුරු භවතෙකුගේ සහාය ලබා ගත යුතු ය. තව ද, මේ කිසිදු තරග අවස්ථාවක අන්තර්ජාලය භාවිත නොකළ යුතු අතර අධ්‍යාපන කලාප මට්ටමින් සපයන පරිගණක උපාංග හැර වෙනත් මෘදුකාංග හෝ දෘඪාංග භාවිත නොකළ යුතු ය. පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණ තරගයේ ජයග්‍රාහකයන් සඳහා අවසන් තරගය පැවැත්වීම අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සිදු කෙරේ. ඉහත දක්වන පරිගණක ග්‍රැෆික් නිර්මාණ ඇගැයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

නිර්ණායක :

- ග්‍රැෆික් නිර්මාණයට සුදුසු අන්තර්ගතය.
- වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැළපෙන බව.
- රේඛා හැඩතල අර්ථවත් ව යොදා ගැනීමේ හැකියාව.
- උචිත වර්ණ තෝරා ගැනීම හා මාධ්‍ය භාවිත කිරීමේ කුසලතාව.
- ආකර්ෂණීය බව හා සාර්ථක නිමාව.

**මූර්ති නිර්මාණ**

මෙම තරග ශීර්ෂය 10-11 හා 12-13 ශ්‍රේණි සඳහා විවෘත ය. එය ඇඹීම නෙළීම, එකලස් කිරීම යන අංශ යටතේ පැවැත් වේ. මෙම සියලු ම මූර්ති නිර්මාණ ඇගැයීම සඳහා පහත සඳහන් නිර්ණායක පදනම් කර ගැනේ.

නිර්ණායක :

- තෝරාගත් අන්තර්ගතය නිර්මාණාත්මකව සැලසුම් කිරීම.
- හැඩතල සංරචනය හා ගති ලක්ෂණ දැක්වීමේ කුසලතාව.
- මූර්ති නිර්මාණවලට අදාළ සිද්ධාන්ත භාවිතය.
- මූර්ති ශිල්ප ක්‍රම භාවිත කිරීමේ කුසලතාව.
- නව්‍යතාව හා ප්‍රශස්ත නිමාව.

**මාධ්‍ය වර්ගීකරණය**

**ප්‍රකාශන චිත්‍ර නිර්මාණකරණයේ දී පහත සඳහන් පරිදි මාධ්‍ය වර්ගීකරණය සිදු වේ.**

| | |
|---|---|
| දිය සායම් මාධ්‍යය - | දිය සායම් ටියුබ්, දිය සායම් පැස්ටල් හා දිය සායම් පැන්සල් වැනි මාධ්‍ය විනිවිද පෙනෙන ශිල්ප ක්‍රමය (Water Color Technique) භාවිතය. |
| පැස්ටල් හෝ ඝන දියර මාධ්‍යය - | පැස්ටල් හෝ වතුර සමග මිශ්‍ර කළ හැකි ඕනෑම වර්ණ මාධ්‍යයක් (ඇක්‍රිලික්, පෝස්ටර් සායම් හා ෆැබ්රික් වැනි වර්ණ) ඝන ආකාරයෙන් භාවිතය. |
| කොලාජ් මාධ්‍ය - | ඇලවීමේ ශිල්ප ක්‍රමය යටතේ, ද්විමාන මතුපිටක් සහිත මාධ්‍ය හා ද්‍රව්‍ය භාවිතය. |
| මිශ්‍ර මාධ්‍ය - | ඇලවීම, සීරීම, තැවරීම වැනි ශිල්ප ක්‍රම යටතේ ඉහත දක්වන ඕනෑම මාධ්‍ය දෙකක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් ද්විමාන මතුපිටක් සහිතව භාවිතය. ඇඳීමේ කඩදාසියට සීමා නො වී ඕනෑම වයනයක් සහිතව A3 කඩදාසි ප්‍රමාණයට සමාන මතුපිටක් භාවිතයෙන් මෙම නිර්මාණය සිදු කළ හැකි ය. |

**මූර්ති නිර්මාණකරණයේ දී පහත සඳහන් පරිදි මාධ්‍ය වර්ගීකරණය සිදු වේ. (විශේෂ තරග අංශය)**

ඇඹීම - ත්‍රිමාණත්වය මතු කර ගැනීම සඳහා කොටස් එකතු කරමින්, තෙරපමින්, ගුලිකරමින් යනාදි ශිල්ප ක්‍රම යටතේ මැටි වැනි මෘදු මාධ්‍යයක් හෝ සිමෙන්ති, හුණු බදාම, කඩදාසි පල්ප්, ප්ලස්ටර් ඔෆ් පැරිස් වැනි මාධ්‍ය භාවිතය

නෙළීම- ත්‍රිමාණත්වය මතු කිරීම සඳහා උත්තල හා අවතල ශිල්ප ක්‍රම යටතේ, අල්ප, අර්ධ, අධි හා පූර්ණ උන්නත ලෙස මතු කළ හැකි මැටි, ප්ලස්ටර් ඔෆ් පැරිස්, සබන්, ඉටි, ලී හා මෘදු පාෂාණ වැනි මාධ්‍ය භාවිතය

එකලස් කිරීම- ත්‍රිමාණත්වය මතු කිරීම සඳහා ඇමිණීම, ඇලවීම යන ශිල්ප ක්‍රම යටතේ ඉවතලන ද්‍රව්‍ය භාවිතය (ප්ලාස්ටික්, ලණු, ඇලුමිණියම්, යකඩ ආදි දිරාපත් නොවන ද්‍රව්‍ය)

**අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මෙහෙයවන**
**සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය - 2025**

# පාසල් මට්ටමින් චිත්‍ර ඉදිරිපත් කිරීමේ දී භාවිත කළ යුතු ආදර්ශ අයදුම්පත (ඇමුණුම 2)

| | | | |
|---|---|---|---|
| සිසුවාගේ / සිසුවියගේ සම්පූර්ණ නම | | | |
| මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | | | |
| පාසලේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | | | |
| පාසලේ ලිපිනය | | | |
| පාසල අයත් පළාත | | පාසල අයත් කලාපය | |
| පාසලේ දුරකථන අංකය | | විදුහල්පතිගේ පෞද්ගලික දුරකථන අංකය | |

| | | | |
|---|---|---|---|
| සිසුවා / සිසුවිය ඉගෙනුම ලබන ශ්‍රේණිය | | සිසුවාගේ / සිසුවියගේ උපන් දිනය | |
| සිසුවාගේ / සිසුවියගේ :පෞද්ගලික ලිපිනය | | | |
| දෙමාපිය / භාරකරුගේ පෞද්ගලික දුරකථන අංකය | | දෙමාපිය / භාරකරුගේ WhatsApp අංකය | |
| ඉදිරිපත් කිරීමට දායක වන ගුරුභවතාගේ නම | | | |
| එම ගුරුභවතාගේ දරකථන අංකය | | එම ගුරුභවතාගේ WhatsApp අංකය | |

| | | | |
|---|---|---|---|
| නිර්මාණය ඉදිරිපත් කරන මාධ්‍යය | | | |
| නිර්මාණ ශීර්ෂ අංකය | | නිර්මාණ ශීර්ෂය | |
| නිර්මාණයේ මාතෘකාව | | | |

මෙහි ඇති නිර්මාණය සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය (2025) සඳහා අප විදුහලේ ඉහත නම සඳහන් සිසුවා/සිසුවිය විසින් සිදු කරන ලද බවත්, මෙම තරගයට නියමිත චක්‍රලේඛය මා ඇතුළු මීට දායක වන ගුරු භවතා /ගුරු භවතුන් විසින් පෞද්ගලිකවම කියවා අවබෝධ කරගත් බවත් එහි **සඳහන්** කොන්දේසි හා **විධිවිධාන පිළිපැදීමට බැඳී සිටින බවත්**, ඉහත සිසුවා / සිසුවිය පිළිබඳ මෙහි සඳහන් තොරතුරු සත්‍ය බවත්, ඔහු / ඇය ඉහත සඳහන් ශීර්ෂයට අයදුම් කිරීමට සුදුසුකම් ලබන බවත්, ප්‍රකාශ කරමි.

විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය:

අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මෙහෙයවන
සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය - 2025

## කලාප තරගයේ දී ඇලවිය යුතු ආදර්ශ තොරතුරු පත්‍රිකාව (ඇමුණුම 3)

| | | | |
|---|---|---|---|
| සිසුවාගේ / සිසුවියගේ සම්පූර්ණ නම | | | |
| මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | | | |
| පාසලේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | | | |
| පාසලේ ලිපිනය | | | |
| පාසල අයත් පළාත | | පාසල අයත් කලාපය | |
| පාසලේ දුරකථන අංකය | | විදුහල්පතිගේ පෞද්ගලික දුරකථන අංකය | |

| | | | |
|---|---|---|---|
| සිසුවා / සිසුවිය ඉගෙනුම ලබන ශ්‍රේණිය | | සිසුවාගේ / සිසුවියගේ උපන් දිනය | |
| සිසුවාගේ / සිසුවියගේ :පෞද්ගලික ලිපිනය | | | |
| දෙමාපිය / භාරකරුගේ පෞද්ගලික දුරකථන අංකය | | දෙමාපිය / භාරකරුගේ WhatsApp අංකය | |
| ඉදිරිපත් කිරීමට දායක වන ගුරුභවතාගේ නම | | | |
| එම ගුරුභවතාගේ දරකථන අංකය | | එම ගුරුභවතාගේ WhatsApp අංකය | |

| | | | |
|---|---|---|---|
| නිර්මාණය ඉදිරිපත් කරන මාධ්‍යය | | | |
| නිර්මාණ ශීර්ෂ අංකය | | නිර්මාණ ශීර්ෂය | |
| නිර්මාණයේ මාතෘකාව | | | |

මෙහි ඇති නිර්මාණය, සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය (2025) කලාප මට්ටමට මාගේ කලාපයෙන් සහභාගී වූ ඉහත නම සඳහන් සිසුවා / සිසුවිය විසින් එම තරග දිනයේ දී නිර්මාණය කරන ලද්දක් බවත්, ඔහුගේ / ඇයගේ නිර්මාණය මෙම තරගයට නියමිත චක්‍රලේඛගත කොන්දේසිවලට අනුකූල බවත් මෙම නිර්මාණය මාගේ කලාපයෙන් පළාත් මට්ටමට තෝරාගත් බවත් සහතික කරමි.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන හා නිල මුද්‍රාව                    දිනය:

**පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය**

මෙම නිර්මාණය, සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය (2025) සඳහා මාගේ පළාතේ කලාප මට්ටමින් පළාත් මට්ටමට තේරී, පළාත් ඇගැයීමේ දී ජාතික මට්ටම නියෝජනය කිරීමට තෝරාගත් බව සහතික කරමි.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන හා නිල මුද්‍රාව                    දිනය:

**අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මෙහෙයවන**
**සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය - 2025**

## මූර්ති අංශයට ඉදිරිපත් වීම සඳහා අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවිය යුතු අයදුම්පත (ඇමුණුම 4)

| | | | |
|---|---|---|---|
| සිසුවාගේ / සිසුවියගේ සම්පූර්ණ නම | | | |
| මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | | | |
| පාසලේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | | | |
| පාසලේ ලිපිනය | | | |
| පාසල අයත් පළාත | | පාසල අයත් කලාපය | |
| පාසලේ දුරකථන අංකය | | විදුහල්පතිගේ පෞද්ගලික දුරකථන අංකය | |

| | | | |
|---|---|---|---|
| සිසුවා / සිසුවිය ඉගෙනුම ලබන ශ්‍රේණිය | | සිසුවාගේ / සිසුවියගේ උපන් දිනය | |
| සිසුවාගේ / සිසුවියගේ :පෞද්ගලික ලිපිනය | | | |
| දෙමාපිය / භාරකරුගේ පෞද්ගලික දුරකථන අංකය | | දෙමාපිය / භාරකරුගේ WhatsApp අංකය | |
| ඉදිරිපත් කිරීමට දායක වන ගුරුභවතාගේ නම | | | |
| එම ගුරුභවතාගේ දරකථන අංකය | | එම ගුරුභවතාගේ WhatsApp අංකය | |

| | | | |
|---|---|---|---|
| නිර්මාණය ඉදිරිපත් කරන අංශය (ඇඹීම / නෙළීම / එකලස් කිරීම | | | |
| නිර්මාණ ශීර්ෂ අංකය | | නිර්මාණ ශීර්ෂය | |
| නිර්මාණයේ මාතෘකාව | | | |

මෙහි ඇති නිර්මාණය සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගය (2025) සඳහා අප විදුහලේ ඉහත නම සඳහන් සිසුවා/සිසුවිය විසින් සිදු කරන ලද බවත්, මෙම තරගයට නියමිත චක්‍රලේඛය මා ඇතුළු මීට දායක වන ගුරු භවතා /ගුරු භවතුන් විසින් පෞද්ගලිකවම කියවා අවබෝධ කරගත් බවත් එහි **සඳහන්** කොන්දේසි හා **විධිවිධාන පිළිපැදිමට බැඳී සිටින බවත්**, ඉහත සිසුවා / සිසුවිය පිළිබඳ මෙහි සඳහන් තොරතුරු සත්‍ය බවත්, ඔහු / ඇය ඉහත සඳහන් ශීර්ෂයට අයදුම් කිරීමට සුදුසුකම් ලබන බවත්, ප්‍රකාශ කරමි.

විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය: